තේමාව :- ජලය

විෂය :- නාට්‍ය හා රංගකලාව

පංතිය :- 6 ශ්‍රේණිය

පාඩම :- පරිසරය ආශ්‍රිත අත්දැකීම්

ඇසුරෙන්

නිර්මාණකරණයේ යෙදීම .

අරමුණු :-

1.ස්වභාවික පරිසරයෙහි දැකිය හැකි විවිධ සිදුවීම් අගය කරමින් කතා

කරයි

2.පරිසරයට අනුගත වෙමින් ජීවන රටාව ගොඩනගා ගනී

3. පාරිසරික ස්වභාවයන් නිර්මාණාත්මකව අනුකරණය කරයි.

4. ගී කවි රචනා ප්‍රබන්ධ කරයි.

5.පරිසරය සුරකින බව ප්‍රකාශ කරයි

පෙර ඉගනුම :-

වැස්ස තේමා කරගත් කවි, ගී , රචනා ,සිතුවම් එකතු කරයි .

වැසි දිනෙක ලත් මිහිරි , අමිහිරි අත්දැකීම් වැඩිහිටියන්ගෙන් අසා දැන ගනී.

පන්ති කාමර ඉගෙනුම්

වැසි දිනයක් දී මැයින් කතාවක් ඉදිරිපත් කිරීමට කැමති දරුවන්ට අවස්ථාව ලබාදීම.

වැස්ස පිළිබඳ දරුවන් ලැබූ අත්දැකීම් සාකච්ඡා කරයි.

ඔවුන් එකතු කරගත් නිර්මාණ ප්‍රදර්ශනය කරයි .

වැස්ස , ස්වභාව ධර්මයටත් මිනිසාටත් බලපාන ආකාරය පිළිබඳ දරුවන් සමඟ සාකච්ඡා කරයි .

දරුවන් කණ්ඩායම් ගත කර වැස්ස පිළිබඳව ඔවුන් ලත් අත්දැකීම් ඇසුරු කරගනිමින් කවි, ගී, විරිදු ,සිතුවම් නිර්මාණය සඳහා යොමු කරවයි.

වැස්ස රංගනයෙන් ඉදිරිපත් කිරීමේදී උපයෝගී කරගත හැකි ක්‍රියාකාරකම් පිළිබඳව දරුවන් දැනුවත් කිරීම.

පසු ඉගනුම් :-

ඒකල ක්‍රියාකාරකම්

එක් එක් දරුවා තමා කැමති ආකාරයට වැස්ස නිරූපණය කර දැක්වීම ට හුරුවීම හා වැස්ස නිරූපණය කර දැක්වීම.

සමූහ ක්‍රියාකාරකම්

1.වැස්ස නිරූපණය කර දැක්වීමට හුරු වීම .

වැස්ස , විදුලිය, සුළඟ නිරූපණය කිරීමට අවශ්‍ය රංග වස්ත්‍රාභරණ කට්ටලයක් සැලසුම් කැරගැනීම .

සුළඟ, වැහි බිංදු ,විදුලි කෙටීම් නිරූපණය සඳහා අවශ්‍ය දෑ සම්පාදනය කරගැනීම. (සළු , සුදු සිල්ව තීරු කරන ලද රෙදි පටි )

අවනද්ධ භාණ්ඩ සහ ආදේශන භාණ්ඩ යොදාගෙන අවශ්‍ය පසුබිම් හඬවල් නිර්මාණය කිරීම . (ගොරවන හඬවල් )

පන්තියේ සිසුන් එක්ව වැස්ස නිරූපණය කර දැක්වීම .

වැස්ස සහ මිනිස් ක්‍රියාකාරකම් දැක්වෙන නාට්‍යමය ජවනිකාවක් නිර්මාණය කිරීම හා රඟදැක්වීම .

පාඩම ඉගනීම සඳහා අවශය සහය ලබා ගැනීමට හැකි මුද්‍රිත,රචිත , online මාධය ( Web පිටු හා සබදතා ) 2018-විකල්ප ඉගනුම් අවස්ථා සහ වර්තමා අවස්ථා ...

1.E තකසලාව

2. නැණ පියස

3.ගුරු ගෙදර

4. 6ශ්‍රේණිය, පෙළපොත්

5.පාලිත ලොකුපෝතාගම,

6 ශ්‍රේණිය නාට්‍ය හා රංග කලාව

කියවීම් පොත .

6. නාට්‍ය හා රංග කලාව ,

මාස්ටගයිඩ් ප්‍රකාශනය,6ශ්‍රණිය .